**පෝරතිව් පත්තු ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**---------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**--------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පෝරතිව් පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**---------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**------------------------**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------------- | ------------- | ------------------------------ |
| (අ) | වාහන 2 කට ඉන්ධන පිරවීම වෙනුවෙන් වැය වූ රු.55,340 ක් සඳහා අවසන් ගිණුම්වල (වියදම් ණයගැතියෝ) කිසිදු ආකාරයක වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදුකර තිබිය යුතු වීම. | මෙය වැරදීමකින් සිදු වූ සිදුවීමකි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දේපල පැවරීම, දැවැදි සහ පරිත්‍යාග මත අයකළ යුතු මුද්දර ගාස්තු රු.15,751,747 ක් ලෙස තක්සේරු කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හිඟ මුද්දර ගාස්තු ලෙස රු.12,344,173 ක් දක්වා නොතිබුණි. | උපචිත ගිණුම් ක්‍රමය පදනම කරගෙන හිඟ මුද්දර ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | මෙම වටිනාකම මුළුමනින්ම නොලැබේ. එම නිසා, සභාවට සත්‍ය වශයෙන්ම ලැබෙන වටිනාකම ගණනය කළ නොහැකි වීම නිසා ගිණුම්වල හිඟ හිටි වශයෙන් දැක්විය නොහැකි විය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ 2017 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු රු.3,498,964 කින් නැගෙනහිර පළාත් භාණ්ඩාගාරයෙන් පරිපාලන වියදම් ලෙස අයකළ 1% ක් හෙවත් රු.34,990 ක් ද මඩකලපුව සහ | මූල්‍ය ප්‍රකාශනවල ලැබූ මුළු ආදායම් පෙන්වා ඉන් ගෙවා තිබූ වියදම් ගෙවූ බවට දැක්විය යුතුවීම. | 2017 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු නැගෙනහිර පළාත් භාණ්ඩාගාරයෙන් පරිපාලන වියදම් ලෙස අයකළ සියයට 1 ක් සහ මඩකලපුව හා කල්මුණේ හි |

| | | |
|---|---|---|
| කල්මුණෙහි පිහිටි දිස්ත්‍රික් සහකාර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට ගෙවා තිබූ රු.69,500 ක් ද ගෙවා තිබූ බව ගිණුම්වල දක්වා නොතිබුණි. | | පිහිටි දිස්ත්‍රික් සහකාර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට නැගෙනහිර පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ඍජුවම ගෙවනු ලබන බැවින් අපගේ ගිණුම්වලට එකතු කර නොතිබුණි. |

## 1.3.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වියදම් ණය හිමියන් ලෙස දැක්වීමේදී එය වර්ෂයක් ඇතුළත නිරවුල් කළ යුතු වේ. එසේ වුවත්, 2013 සහ 2014 වර්ෂ කාලපරිච්ඡේදයේ රු.143,847 ක වියදම් ණයහිමියන් ලෙස දැක්වීම මේ දක්වා නිරවුල් නොකර වර්ෂ 06 කට අධික කාලයක සිට වියදම් ණය හිමියන් යටතේ දැක්වුණි. | වියදම් ණය හිමියන් ලෙස දැක්වුවහොත් එය වර්ෂයක් ඇතුළත් නිරවුල් කල යුතු වීම. | වියදම් ණයහිමි ගිණුමේ 2013 සහ 2014 වර්ෂවලදී රු.143,847.00 ක ආරම්භක ශේෂය වූ රු.81,397.26 ක් හඳුනා නොගත් ශේෂයක් ලෙස පැවති අතර සුරවනෙයියඩියුවිරු පොදු ළිඳ සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා වූ රු.64,450.62 ක් තවමත් කර්මාන්තය අවසන් නොවූ බැවින් ගෙවීම් කර නොතිබුණි. මෙම වටිනාකම මෙම වර්ෂයේ ආදායමට මාරුකිරීමට කටයුතු කර ඇත. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2018 ජුලි 09 දින පලකරනු ලැබූ 34 වැනි පසු ඇමුණුම් 2.14.1 | රු.200,000 කට අධික වාහන අලුත්වැඩියා වියදම් සඳහා පූර්ව අනුමැතිය අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලබාගත යුතුය. එසේ | සභාවේ තීරණය සමඟ අදාළ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් අලුත්වැඩියා සිදුකළ යුතු වීම. | සභාවේ අරමුදල් උපයෝජනයේදී සභාවේ තීරණය මත වැය කළ හැකි බව සඳහන්ව ඇත. එසේම, වෙනත් මූලාශ්‍රවලින් ලැබෙන මුදල් සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය |

| | | | | |
|---|---|---|---|---|
| | | වුවත්, මෙයට පටහැනිව සභාව විසින් අංක GZ 3838 දරන වාහන අලුත්වැඩියාව සිදුකර තිබුණි. | | ලබාගත යුතුය. (පිටපතක් අමුණා ඇත. ඇමුණුම 4) |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ IV වගන්තිය | අමතර කාලය සඳහා ගෙවනු ලබන වැටුප් සම්බන්ධයෙන්, වේලාව ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් තහවුරු කරගත යුතුය. එලෙස සඳහන් වුවද ඇඟිලි සලකුණු නොතබා සේවකයින් 24 දෙනෙකුට අමතර කාලය සඳහා වැටුප් ගෙවා තිබුණි. | අමතර කාලය සඳහා ගෙවීම් සිදු කිරීමේදී එම වේලාව ඇඟිලි සලකුණු තැබීම මඟින් තහවුරු කිරීමෙන් අනතුරුව පමණක් ගෙවීම් සිදුකළ යුතුය. | අප සභාවේ රාජකාරී කරන නිලධාරීන් විශේෂ කාර්යභාරයක් ලෙනස මන්ඩූර් මුරුගන් කෝවිලේ රාජකාරී කිරීම වෙනුවෙන් සහ ඇඟිලි සලකුණු යන්ත්‍රය කාර්යාලය ඇතුළත සවිකර තිබීම නිසා සෙනසුරාදා, ඉරිදා දිනයන්හි රාජකාරී කරනු ලබන ජලය බෙදාහැරීමේ කම්කරුවන් ඇඟිලි සලකුණු තබා නැත. වර්තමානයේ මෙම යන්ත්‍රය පිටත සවිකර ඇඟිලි සලකුණු තබනු ලබයි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන හා කලමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 3.1 ඡේදය | සියළුම ඉන්ධන දහනය පරීක්ෂාවෙන් පසුව මාස 12 ක කාලයෙන් පසුව නැතහොත් කිලෝමීටර් 25,000 ක දුර ධාවනයෙන් පසුව නැතහොත්, සම්පූර්ණ එන්ජිමේ අලුත්වැඩියාවකින් පසුව ආදී කාරණාවන්ගෙන් පළමුව එළැඹෙන අවස්ථාවෙන් පසුව ඉන්ධන දහනය පරීක්ෂාවක් සිදුකළ යුතුය. එසේ වුවත්, එවැනි පරීක්ෂාවක් සිදු වී නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා ඉන්ධන දහනය පරීක්ෂාවක් සිදුකර තිබිය යුතුය. | ඉන්ධන දහනය පරීක්ෂාව සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.78,699 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,356,779 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,435,478 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

## 2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තු සාරාංශයේ වරිපනම්වලින් රු.1,100,000 ක ආදායමක් ලබාගත හැකි බව දක්වා තිබුණි. එසේම, සභාව විසින් වරිපනම් බදු අයකරනු ලබන බව 2018 අප්‍රේල් 18 දිනැති අංක 04/02 දරන දෙවන වර සැසිවාරයේ තීරණය ගෙන තිබූ නමුත් එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ අයකිරීම සඳහා කිසිඳු ආකාරයක ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එම නිසා, සභාවට මෙම ප්‍රමාණයෙන් ආදායම් අහිමි වී තිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු අයකර තිබිය යුතු වීම. | වරිපනම් බදු එකතු කිරීම සඳහා විස්තර දැනට එකතු කරමින් පවතී. තොරතුරු රැස්කළ විගසින් අයකිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීමපිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) මූල්‍ය ප්‍රතිපාදන සලසා නොතිබීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 15 කින් ක්‍රියාකාරකම් 06 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණි. අනෙකුත් ක්‍රියාකාරකම් සභාවේ නිර්දේශ අනුව, වෙනස් කර ක්‍රියාත්මක කර තිබුණි. මේ නිසා මහජනතාවට අවශ්‍ය යැයි හඳුනාගෙන යෝජනා කර තිබූ වැඩසටහන් 09 ක්‍රියාත්මක කළ නොහැකි වී තිබුණි. | සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව මූල්‍ය ප්‍රතිපාදන සලසාගෙන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර තිබිය යුතුය. | 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් 15 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණත්, ක්‍රියාකාරකම් 06 ක් පමණක් අපහට ඉටුකළ හැකි වී තිබුණි. අනෙකුත් ක්‍රියාකාරකම් 09 සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉටුකිරීමට නොහැකි වී තිබුණි. |

**(ආ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ 2013 වර්ෂයේදී රු.7,232,236 ක ඇස්තමේන්තුවක් මත සභා බල ප්‍රදේශයේ පිහිටි සින්නවත්තෙයි ගම්මානයේ මහජන පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. මෙය 2013 මැයි 31 දින නිම කළ යුතුව තිබුණද, සභාවේ ඵලදායී නොවූ ක්‍රියාකාරකම් හේතුවෙන් රු.1,935,449 ක් වටිනා කාර්යයන් පමණක් අවසන් කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ විවිධ මූලාශ්‍ර මඟින් එකතුව රු.1,021,476 ක් වැය කර තිබුණද, මෙම පුස්තකාල ගොඩනැගිල්ල සම්පූර්ණ කර මහජන භාවිතය සඳහා ලබා නොදී වර්ෂ 06 ක් නිෂ්කාර්යව පැවතුණි. | මෙම ගොඩනැගිල්ල සම්පූර්ණ නොකළ බැවින් අදාළ ගම්මානයේ ජනතාවට පුස්තකාල පහසුකම් ලබාගත නොහැකි වී තිබුණි. | දැයට කිරුළ වැඩසටහන යටතේ 2013 වර්ෂයේ රු.8,000,000 ක ඇස්තමේන්තුවක් මත ක්‍රියාත්මක කළ දැයට කිරුළ වැඩසටහන අතරමඟ නවතා දැමීම හේතුවෙන් රු.1,900,000 ක කාර්යයන් පමණක් ඉටුකර තිබුණි. සින්නවත්තෙයි මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ වැඩ අවසන් නොවූ බැවින් එය අඛණ්ඩව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන පදනම් වූ සංවර්ධන අරමුදලින්, සභා අරමුදල මඟින් ප්‍රමාණාත්මක වැඩ කොටසක් සම්පූර්ණ කර තිබුණි. එසේ වුවත්, පුස්තකාල ගොඩනැගිලි වැට පමණක් නොකර පැවතුණි. මෙම කාර්යය අප්‍රමාදව සම්පූර්ණ කර මාස 2 ක් ඇතුළත මහජන උපයෝජනය සඳහා විවෘත කරනු ලැබේ. |

(ii) **ශක්තිමත් කිරීමේ වැඩසටහන**

| | | |
|---|---|---|
| ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2016 වර්ෂයේදී විවිධ වැඩසටහන් සඳහා වූ කාර්යයන් නිම කළ බවට වාර්තා ඉදිරිපත් කර තිබුණද, 2017 වර්ෂයේදී තැන්පත් කරනු ලැබූ මුදලින් රු.1,820,664 ක් වටිනා වැඩසටහන් 2018 අප්‍රේල් 18 දින වන විටත් නිම කර නොතිබුණි. | අදාළ කාර්යයන් ඉටු නොකළ බැවින්, මහජනතාවට අවශ්‍ය පහසුකම් සලසා දී නොතිබුණි. | ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සම්පූර්ණ නොකළ වැඩසටහන්වලින් කලුමුන්දන්වෙලි, පලාච්චෝලෙයි, සුරවනෙයියඩියුවරු වැනි ගම්මානවල වැඩසටහන් මෙම වර්ෂයේ අවසන් කර ඇත. තවදුරටත් රු.750,000 ක් වටිනා කාර්යයන් තව මාසයක් හෝ දෙකක් ඇතුළත අවසන් කෙරේ. |

(ඇ) **සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සභාව විසින් ක්‍රියාත්මක කළ දීර්ඝකාලීන හා කෙටිකාලීන වැඩසටහන් සඳහා පසුගිය සහ සමාලෝචිත වර්ෂයේ රු.2,169,564 ක් වැය කර තිබුණි. එසේ වුවත්, සන අපද්‍රව්‍ය කළමනාකරණය කරන මධ්‍යස්ථානය වශයෙන් ස්ථාපිත කළ විවේකානන්දපුරම් අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානය වර්තමානයේ කිසිඳු ආකාරයක භාවිතයකින් තොරව පැවතුණි. එසේම, කාබනික පොහොර නිෂ්පාදනය සහ ප්‍රතිචක්‍රීයකරණ විකුණුම් වැනි සැලසුම් ක්‍රියාත්මක කර ආදායම් උපයාගැනීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සන අපද්‍රව්‍ය කළමනාකරණය මඟින් කාබනික පොහොර නිෂ්පාදනය සහ ප්‍රතිචක්‍රීයකරණ විකිණීම් වැනි සැලසුම් මඟින් ආදායම් ඉපැයීමට හැකිය. | සන අපද්‍රව්‍ය කළමනාකරණය සැලැස්ම යටතේ විවේකානන්දපුරම් හි ස්ථාපිත කර ඇති එකතු කිරීමේ මධ්‍යස්ථානය සඳහා කාබනික පොහොර සකස් කිරීමේ යන්ත්‍රෝපකරණ නොමැති වීමෙන් මධ්‍යම රජයේ මධ්‍යම පරිසර අධිකාරියෙන් මේ පිළිබඳව සැලසුම් වාර්තාවක් (Proposal) ඉදිරිපත් කර ඇත. ඔවුන් විසින් ලබාදෙනු ලබන බවට තහවුරු කර ඇත. මේ සඳහා අවශ්‍ය උපකරණ ලැබූ විගස මෙම ක්‍රියාවලිය මුළුමනින්ම ක්‍රියාත්මක කරනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි රු.2,100,000 ක් ලී බඩු උපකරණ රු.233,600 ක් පුස්තකාල පොත් රු.192,001 ක පොත් අගය පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | කපා හැරීම සඳහා කටයුතු කළ යුතුව තිබුණි. | කපා හැරීම සඳහා කිහිප අවස්ථාවකදීම අදාළ දෙපාර්තමේන්තුවට යවා තිබුණත්, මේ දක්වා අනුමැතිය ලැබී නොතිබුණි. මේ පිළිබඳව නැවතත් කපා හැරීමේ අනුමැතිය ලබාගැනීම සඳහා අදාළ දෙපාර්තමේන්තුවට යවනු ලැබේ. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් විකුණුම් මත සියයට 1 ක විකුණුම් බදු අයකළ යුතුය. එසේ වුවත්, 2017 වර්ෂයේ විකුණනු ලැබූ සියළුම ඉඩම්වල මුළු වටිනාකම රු.115,785,249 කින් බදු ලෙස රු.1,157,852 ක් අයකිරීම සඳහා සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය අනුව ඉඩම් විකුණුම් මත බදු අයකිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. | අදාළ ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක බද්දක් ඉදිරි කාලයේදී අයකිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**3.4 ප්‍රසම්පාදනය**

**3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සභාව විසින් සැපයුම් හා සේවා ක්‍රියාවලිය සඳහා සකසා තිබිය යුතුය. එසේ වුවත්, සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබිය යුතුය. | අප සභාව විසින් ඉදිරි අනාගතයේදී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු රු.1,100,000 ක් රැස් කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණත්, කිසිඳු අයකිරීමක් අයකර ගෙන නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය අනුව, වරිපනම් බදු අයකිරීම සඳහා කටයුතු කර තිබිය යුතුය. | රැස්කළ යුතු වරිපනම් බදු සම්බන්ධයෙන් තොරතුරු රැස්කිරීමේ කාර්යයන් ක්‍රියාත්මක වෙමින් පවතින අතර, මෙම වර්ෂයේදී අයකිරීම සඳහා කටයුතු කරනු ලැබේ. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සභාවේ අභ්‍යන්තර විගණන කාර්යයන් සිදු වී නොතිබුණි. | අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කළ යුතු වීම. | ඉදිරියේදී අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කරනු ලැබේ. |

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පැවැත්විය යුතු වීම. | සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම ප්‍රමාණයක් පවත්වා ඇත. ඉදිරි කාලයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු යොදනු ලැබේ. |

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. | ඔබ විසින් අනාවරණය කරනු ලැබූ ආකාරයට ආදායම් කළමනාකරණය, අයවැය පාලනය, ස්ථාවර වත්කම් පාලනය වැනි ක්‍රියාකාරකම් ඉදිරි කාලයේදී, පසුගිය කාලයේ සිදු වූවාට වඩා ඉතා හොඳින් ක්‍රියාත්මක කරනු ලබන බවත්, ඔබ විසින් අනාවරණය කරනු ලැබූ අනෙකුත් අඩුපාඩු ද නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බවත් කාරුණිකව දැනුම් දෙමි. |
| (ආ) අයවැය පාලනය | අයවැය පිළියෙල කිරීමේදි පසුගිය වර්ෂවල තථ්‍ය වියදම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | |
| (ඇ) ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>(ii) සභාවේ භාවිතා නොකර නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් භාවිතා කිරීමටපියවර ගැනීම. | |